බන්ධනාගාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ :- **16 /2018**

මගේ අංකය :- බ12/08/වා.භා.ස/2018/18,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2018-11-21.

සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීන්, සහකාර බන්ධනාගාර අධිකාරීන්.

**<u>2018-12-31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීම.</u>**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගේඅංක PFD/RED/03/03/01 හා 2016.03.31 දිනැති රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 පරිදි 2018 වාර්ෂික ගබඩා භාණ්ඩ සමීක්ෂණය පහත පරිදි නිම කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.තව ද මු.රෙ.128 (1) (ඉ) වගන්තිය අනුව රජය සතු වූ හෝ රජය භාරයේ පවත්නා මුදල් , බඩු බාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව පවත්වාගැනීම හා සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් හා විධිමත් විධිවිධාන යොදනු ලබන බවට හා ඒවා වරින් වර සත්‍යාපනය කරනු ලබන බවටත් ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරණු ලබන කල් හි එසේ නිෂ්කාෂණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස් වලට අනුකූලව කරණු ලබන බවටත් සෑහීමකට පත් විය යුතුය.එසේම මු.රෙ.128 (1) (ඉ) වගන්තිය අනුව භාණ්ඩාගාරය විසින් ඉල්ලා සිටින තොරතුරු ප්‍රකාශ හා සමීක්ෂණ වාර්තා නිවැරදිව හා කලට වේලාවට ඉදිරිපත් කළ යුතුය.

1. 2019.03.15 දිනට පෙර භෞතිකව භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරිම.
2. 2019.03.31 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණයේ සමීක්ෂණ වාර්තාව මූලස්ථානය වෙත ඉදිරිපත් කිරිම .
3. 2019.04.15 දිනට පෙර සමීක්ෂණ වාර්තාව පරිදි ඌනතා හා අතිරික්ත සසදා වාර්තා කිරිම සහ ක්‍රියාත්මක කිරීම.
4. 2019.04.30 දිනට පෙර පොදු 47 වාර්තාවට අනුව විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කිරිම,අළුත්වැඩියා කළයුතු භාණ්ඩ අළුත්වැඩියාව, වෙන්දේසි කළයුතු භාණ්ඩ වෙන්දේසි කිරිම හා වෙනත් රජයේ ආයතනවලට පැවරිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කර අවසන් කිරිම.
5. 2019.06.15 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට ද පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
6. 2019-06-30 දිනට පෙර අපහරණය කරණ ලද වත්කම් පිළිබඳ තොරතුරු, 2006.07.30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 422 හි ඇමුණුම් ප්‍රකාරව ලේඛණගත කර 2019-06-30 දිනට පවතින වත්කම් පිළිබඳ වාර්තාව සමීක්ෂණ වාර්තා සමග රාජ්‍ය මුදල් අධ්‍යකෂ ජනරාල් වෙත වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කිරීම.

ඉහත කාලසටහන අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර අවසන් කිරිම වෙනුවෙන් එම කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් කර ඇති ලිපි, චක්‍රලේඛ හා උපදෙස් පිළිබඳව ද ඇඩි අවධානය යොමු කරණ මෙන් කාරුණිකව දන්වමි.( මෙම චක්‍රලේඛය සමග පහත චක්‍රලේඛයන් ද දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය).

- බන්ධනාගාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ - අංක 26 / 2016 - 2016-10-25
- බන්ධනාගාර,ප්‍රතිසංස්කරණ,පුනරුත්තාපන,නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ අංක MPRRH/06/06/01/09 දරණ ලිපිය. - 2016.07.07
- බන්ධනාගාර,ප්‍රතිසංස්කරණ,පුනරුත්තාපන,නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ අංක S/1/001 දරණ ලිපිය. - 2017.08.16

- රාජ්‍ය මුදල් චක්‍රලේඛ - අංක පීඑෆ්/439 - 2009-07-21
- රාජ්‍ය මුදල් චක්‍රලේඛ - අංක 422 - 2006-07-30

- තොග භාණ්ඩ කපා හැරීම හා ඉවත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමට පෙර මු.රෙ.101 සිට 109 දක්වා විධිවිධාන අනුගමනය කර තිබිය යුතුය.

තව ද ,

- 2018 වසර අවසන් වන තුරු නොසිට අදාල ආකෘතිපත්‍ර ලබාගෙන නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී සමීක්ෂණයට අදාල සියළුම කටයුතු නිම කිරීමට ගබඩාව භාර නිලධාරීන්ට අදාල උපදෙස් ලබාදෙන්න. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ ගබඩා භාණ්ඩවලට අමතරව කාර්මික හා කෘෂිකාර්මික අත්තිතාරම් ගිණුමට අදාල භාණ්ඩ සදහාද භාණ්ඩාගාර 66 ආකෘතිපත් සම්පූර්ණ කර තිබිය යුතුවේ. තව ද සුභසාධක ගිණුමට අදාලව ආකෘති වෙනම සකස් කළ යුතුවේ.
- පිටපත් 05 කින් සකස් කරණ ලද භාණ්ඩාගාර 66 ආකෘතිපත් වලින් එක් පිටපතක් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත 2019-01-05 වැනි දිනට පෙර යොමු කළ යුතු වේ.
- මෙ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ යුතු ආකාරය දැක්වෙන, බන්ධනාගාර කොමසාරිස් (මුදල්) විසින් ලබාදෙනු ලබන අමතර උපදෙස් අදාල නිලධාරීන්ට ලබාදීමට කටයුතු කළ යුතු වේ.

එච්.එම්.එන්.සී.ධනසිංහ,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

පිටපත්:- 01. විගණකාධිපති - දැ.ග.ස.

02. රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් - දැ.ග.ස.